Department of Education,Sabaragamuwa Province/ Weekly School

# සති පාසල කාර්ය පත්‍රිකාව

**1. නිපුණතාව 3.0 :** නාට්‍ය හා රංගකලා සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි.
**නිපුණතා මට්ටම 3.5 :** සතර අභිනය භාවිතා කරයි.
**පාඩම 3.5.3 :** නාට්‍ය ශෛලීන්ට උචිත සංවාද භාවිතා කරමු.

## 2.ශිෂ්‍යයා විසින් කල යුතු කාර්යයන්:

- වාචික අභිනය හඳුනා ගැනීම.
- ලෝකධර්මී සහ නාට්‍යධර්මී නාට්‍ය වල වාචික අභිනය භාවිතා කර ඇති ආකාරය හඳුනා ගැනීම.
- පහත දී ඇති ඉගෙනුම් පත්‍රිකා හා අනෙකුත් ඉගෙනුම් ආධාරක ඇසුරෙන් දි ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.

- වාචික අභිනය භාවිතා කිරීමේදී අවධානය යොමු කල යුතු කරුණු සම්බන්ධයෙන් වැඩි දුරටත් තොරතුරු එක් රැස් කරන්න.

- පාසල ආරම්භයේදී ඔබගේ අනාවරණයන් පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්න.

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත, කියවීම් පත්‍රිකා, Websites සහ ඉගෙනුම් ආධාරක :-**

- **eතක්සලාව -**
  https://www.e-thaksalawa.moe.gov.lk/web/en/

- **eනැණපියස -**
  course : 09 ශ්‍රේණිය නාට්‍ය හා රංගකලාව
  https://enenapiyasa.lk/

- **You Tube –**

**නරිබෑනා**

https://youtu.be/g5xR3PX3yzs

**එලොව ගිහින් මෙලොව ආවා**

https://youtu.be/wazWAsU94RA

සුභ සහ යසස

https://youtu.be/KJRmdTra6MQ

- **කියවීම් පත්‍රිකාව -**

**නාට්‍ය ශෛලීන්ට උචිත සංවාද භාවිත කරමු.**

- සංවාද භාවිතය වාචික අභිනයට අයත් වේ.
- ලෝකධර්මී ශෛලියට අයත් සංවාද භාවිතයන් සහ නාට්‍යධර්මී ශෛලියට අයත් සංවාද භාවිතය නාට්‍යයක දැකිය හැකි ය.
- නාට්‍ය ධර්මී සංවාදව රිද්මයක්, තාලයක් ඇති අතර, ගීත බහුලව මෙම නාට්‍යවල දැකිය හැකි ය.
- නාට්‍ය ධර්මී සඳහා විවිධ ජන නාටකවලින් ද රබන් පද, සේදම් වැනි අංගවලින් ද තා හා පද වයාදාවගන ඇත.
- නාට්‍ය ධර්මී සංවාද ඉදිරිපත් කරන විට සංගීතය හා නර්මතනය ද වයාදාගනී.
- නාට්‍ය ධර්මී නාට්‍ය සඳහා උදාහරණ ලෙස, මනමේ, සිංහබාහු , නරිබෑණා, එලොව ගිහින් මෙලොව ආවා, වැනි නාට්‍ය ව එන නාට්‍ය ධර්මී සංවාද දැක්විය හැකි ය.
- ලෝක ධර්මී සංවාද, එදිනෙදා ව්‍යවහාර භාෂාවට සමීප වන අතර සාමාන්‍ය ජීවිතයේ ගැහැණුන් මිනිසුන් කථා කරන ආකාරයට සංවාද භාවිත වුවත් ඒවා නාටෝ්‍යචිත ව යොදාගත යුතු වේ.
  උදා:- සුබ සහ යස, තලමල පිපිලා, විකෘති

- ## නාට්‍යධර්මී සංවාද සඳහා උදාහරණ

ගමමහගේ : තෝව දෙන්නෙත් නරියටයි
තෝව ගන්නෙත් නරියෙකුයි
තෝව දෙන්නෙත්, තෝව ගන්නෙත්
කැලේ ඉන්නා නරියෙකුයි (නරිබෑනා)

හිඟන්නා : මෙලොවෙ දී තව තව ලැබෙන්න
එලොවෙ දී දුක නැතුව ඉන්න
දිව මාළිග පහළ වෙන්න
පිනට මොකුත් මට ලැබෙන්න

දෙමවුපියන් දූ දරුවන්
නාමෙට පින් පමුණුවන්න
මළගිය ඇත්තන් වෙනුවෙන්
පිනට මොකුත් මට ලැබෙන්න (එලොව ගිහින් මෙලොව ආවා)

නරියා : ඉතිං සැනසෙන්න
හොඳින් පුළුවන්නෙ
දෙමව්පියො දෙන්න
ඇවිත් අර ඉන්නෙ
මෙතෙක් උඩ පැන්නෙ
ගමින් එන කන්නෙ
හුඟක් දෑවැද්ද
ගෙනැත් ඇති වෙන්නැ
ගොඩක් බඩු මුට්ටු
ගෙනත් ඇති වෙන්නැ
හොඳින් කලරින්න
ඉතින් පුළුවන්නෙ (නරිබෑනා)

කළුහාමි මමත් හිටිය හම්බ වෙන්න
එලොව ගිහින් ආපු කෙනෙක්
එහේ ඉන්න මගේ දුවගෙ
සුවදුක් දැනගන්න අහල
කළුහාමිගෙ දුව කිච්චම
කොයි කවුරුත් දන්නව ඇති
කොහොමද දුව සනීපෙන් ද?
අපිව මතක නැති වෙලා ද? (එලොව ගිහින් මෙලොව ආවා)

නරියා : සුරුට්ටු ද බොන්නෙ - බුලත් ම ද කන්නෙ
ගමරාළ : හෙනං ගෙන එන්න - සුරුට්ටුව බොන්න
නරියා : පයිං ඇවිදිල්ල - මහන්සි ද මන්ද
කපුරාළ : ගොඩින් පැන ගත්ත - හුඟක් ළඟ හින්ද
නරියා : මෙහෙත් හරි වැස්ස - වෙලත් උතුරන්න (නරිබෑනා)

- **ලෝක ධර්මී සංවාද සඳහා උදාහරණ**

රජු - මට දවල් වෙනකන් බුදියන්ඩ ඕනෑ
මහ ඇමති - එසේය මහරජතුමනි
රජු - මේ වන්දිභට්ටයින් ගේ ගායනාව නතර කරන්ඩ ඕනෑ
මහ ඇමති - එසේ ...... අවසර මහරජතුමනි, වන්දිභට්ටයින් ගේ ගායනා මහා සම්මත කාලයේ හිටන් ඉටු කරන්නා වූ චාරිත්‍රයකි.
මහ රජු - මොන සම්මත කාලයේ ඉඳලා තිබුණත් මට ඒක හිරිහැරයක්
මහ ඇමති - සමාවෙන්න මහ රජතුමනි, රාජ ගෞරවය පවතින්නේ පරම්පරාවෙන් පරම්පරාවට පැවතුණා චාරිත්‍ර උඩ
රජු - ඇමති, ඇමති මෙහෙ බලනවා, චාරිත්‍ර ද ආරක්ෂා කරන්නට ඕනෑ. මාව ද ආරක්ෂා කරන්ට ඕනෑ.
මහ ඇමති - රාජ චාරිත්‍ර ආරක්ෂා වෙන කොට රාජ ගෞරවය ආරක්ෂා වෙනවා. රාජ ගෞරවය ආරක්ෂා ඕනෑ.
රජු - ඒ උනාට මිනිහෝ නිදිමතේ පුළුවන් ද හැමදාම රටක් පාලනය කරන්ඩ.

(සුභ සහ යස)

## 4.මෙම සතියට නියමිත පාඩම මඟින් ආවරණය විය යුතු ඉගෙනුම් ඵල:

- වාචික අභිනය යනු කුමක්දැයි හඳුනා ගැනීම.
- ලෝකධර්මී හා නාට්‍යධර්මී නාට්‍ය වල වාචික අභිනය භාවිතා කර ඇති ආකාරය හඳුනා ගැනීම.
- වාචික අභිනය භාවිතා කිරීමේදී අවධානය යොමු කල යුතු කරුණු හඳුනා ගැනීම .
- වාචික අභිනය නිවැරදිව පුහුණු වීම .

## 5.ඇගයීම /තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘති:

1. නාට්‍ය සංවාද අයත් වන්නේ කවර අභිනයට ද?
2. නාට්‍ය ධර්මී සංවාද තුළ දක්නට ලැබෙන ලක්ෂණයක් ලියන්න.
3. ලෝකධර්මී සංවාද තුළ දක්නට ලැලෙන ලක්ෂණයක් ලියන්න.
4. පහත සඳහන් චරිත යොදා ඔවුන් අතර සිදු වන සංවාද ලියා දක්වන්න.එහිදී එදිනෙදා භාවිත කරන බස් වහර යොදන්න.
   - වරදක් කර හසුවූ සිසුවෙක් හා විදුහල්පති අතර ඇති වන සංවාදය.
   - ගමරාළගේ කුකුල් කොටුවෙන් කුකුලළකු සොරකම් කර යන අප්පුවා, ගමරාළ ගේ අතට හසු වූ පසු ගමරාළ හා අප්පුවා අතරඇති වන සංවාදය.
5. පහත සඳහන් චරිත අතර සංවාද ලිඛිත ලෙස යොදා නිර්මාණය කරන්න.
   - මිය යෑමට සිටින පිය රජු හා කුමාරවරුන් තිදෙනකු අතර ඇතිවන සංවාදය
   - අන්දරේ සීනි කෑමෙන් පසු රජතුමා හා අන්දරේ අතර ඇතිවන සංවාදය.

     ඔබ ඉහත නිර්මාණය කළ සංවාදයන් ඉදිරිපත් කිරීමට උත්සහ කරන්න.

සැකසුම :- S.S.C ජයසූරිය

ර/නිවි/සිංහලගොඩ විද්‍යාලය